Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
## (බාහිර) - 2009

### මානවශාස්ත්‍ර පීඨය

### සිංහල - SINH - E1025

### චිරන්තන සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය

**පළමුවන ප්‍රශ්නය ද, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** | **කාලය : පැය 03 යි**

---

## 1 කොටස

01. අ) පහත දැක්වෙන ඡේදය ලිහිල් බසින් ලියා ඊට අදාළ අවස්ථා සම්බන්ධය දක්වන්න.

තමන් දෑ ඉතා වයස්ගත වැ සිට බාල ස්ත්‍රීන් පළඳනා වූ මිණිමෙවුල්දම් ආදි නො පැළැන්ද මනා පළඳනා පැළැඳ, මා අමාත්‍ය මණ්ඩලයා පිරිවරා සිංහාසනාරූඪ වැ උන් කල්හි බොහෝ දෙනාට පෙනෙන පරිද්දෙන් සක්මන් කොට ඇවිදිනා දෑ ය. පැළැන්දා වූ මණිමේඛලාදාමයෙහි ශබ්දය සියලු රජ ගෙයි ඒකනිනාද කරමින් සිටිනී ය. අමාත්‍ය මණ්ඩලයා මැද උන් මම මුන් වහන්සේ පැළැඳි ආභරණයෙහි ශබ්දය තියා දූන, ලජ්ජායෙන් කර බාමි. අමාත්‍ය සමූහයා ඔවුනොවුන් මුහුණ බලන්නාහ. තවත් නොකටයුත්තක් බලා වදාළ මැනැව. මුන් දෑ ඉඳුල් කන්නටත් තරම් නුවූ දොරටුපාල කොල්ලන් ද ඇත් ගොව්වන් ආදීන් ද කැඳව-කැඳවා බොහෝ වේලක් උන් හා සමඟ මහත් කොට සිනාසෙන දෑ ය. මා සතු ප්‍රත්‍යන්ත රජ දරුවනට මා යැවුවා කොට, පත් ලියා යවන කල මා ගේ මැණියන් දෑ මැහැලි නොවන දෑ ය: සොළොස් හැවිරිද්දෙහි සිටියනටත් මුන් දෑ වඩනා දෑ ය. මෙ නම් රජ්ජුරුවෝ අවුත් තමන් බිරිය කොට යෙත් ව'යි මට සොරා පත් යවන දෑ ය. රජදරුවෝ පත් බලා පියා හයින් තැති ගෙන නැවැත මට පත් එවන කල, 'අප තමන් වහන්සේ ගේ සේවකයන් වුව, මෙ සේ නොතරම් කටයුතු කියා එවූයේ ඇයි දූ' යි පත් එවන්නාහ. ඒ ගෙනා පත් සබයෙහි කියන්නට වන් කල, 'ඉස් වද්දන තැනක් නැත්තා සේ මහා ලජ්ජාවෙන් පොළොව පැළී නො යන සේ යැ' යි සිතමි.

ආ) පහත දැක්වෙන පද්‍ය පන්තියේ අදහස ලිහිල් බසින් ලියා රසාස්වාදය කරන්න.

මිහිලොල් බිඟු සරේය වන ස රේය
ග ඟු ලැල් වැද සිරේය ගිරි සි රේය
පි පි ස ල් සපු තුරේය විසි තු රේය
ව න සි රි සඳ කෙරේය ලොබ කෙ රේය

ගිරි නිල්මල් ර ඟා ය පිල් නඟාය
කැරැ සෙබඩුන් ළ ඟා ය මන රඟාය
රිවි දෙව්හට ර ඟා ය ගිරි රඟාය
සිටි මොනරුන් ම ඟා ය වන මඟාය

කිරි ලෙස සමත ලා ය වැලිතු ලාය
සැදි සුවඳැති ම ලා ය වන ම ලාය
එන වනසර ක ලා ය මන ක ලාය
දූක නෙත් ලත් ප ලා ය ලැබ ප ලාය

අ.පි.බ.

පැතිරෙන ගඟුලැලී ලෙළ තුරුසළු සි ලී
කසමල් හෙල් මැලී මිණි බරණින් දි ලී
රනහස වැ ළ කු ලී බඳ මිණි මේක ලී
විලසක ලෙස බ ලී බල සැදි වන වි ලී

සඳකැන් මෙන් නි සා එන ගඟුලැලි නි සා
ගිළි මල් රොන් ව සා යන මිණිනිල් ව සා
වන විල් සුව හ සා දෙන රැවි සුව හ සා
එවනෙහි ම ග අ සා දක යව අස අ සා

## 11 කොටස

02. **'උම්මග්ග ජාතකයේ** ඉතා ම සිත් ගන්නා අංගය වනුයේ ප්‍රභූ ජනයා වෙත එල්ල කෙරුණු තියුණු උපහාසයයි.' විමසන්න.

03. **හංස සන්දේශ** කතුවරයාගේ වර්ණනා චාතුර්‍ය්‍ය සනිදර්ශන ව පහදන්න.

04. 'කුරුණෑගල සාහිත්‍යය පෝෂණය වූයේ තත්කාලීන ගද්‍ය නිර්මාණවලිනි.' සාකච්ඡා කරන්න.

05. සිංහල සන්දේශ කාව්‍ය ආරම්භයත් සමඟ ම පද්‍ය සාහිත්‍යයේ ඇතිවූ පෙරළිය පැහැදිලි කරන්න.

06. කෝට්ටේ යුගය දීප්තිමත් අවධියක් බවට පත් කිරීමට තත් කාලීන කවීන්ගෙන් ලැබුණු දායකත්වය පිළිබඳ ව විමර්ශනයක් කරන්න.

## 111 කොටස

07. භාෂාව හා සංස්කෘතිය අතර ඇති අවියෝජනීය සම්බන්ධය පහදන්න.

08. උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය පිළිබඳ හැඳින්වීමක් කොට භාෂණ සිංහලයේ ශබ්ද මාලාව නම් කරන්න.

09. මානව ශිෂ්ටාචාරයේ අභිවර්ධනය සඳහා භාෂාවේ කාර්යභාරය පිළිබඳ විමසීමක් කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් <u>සතරක්</u> තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

I. ආයාසී සන්ධි හා නිරායාසී සන්ධි
II. පූර්ව නාසික්‍ය ව්‍යඤ්ජන
III. අනම්‍යාදේශය
IV. ප්‍රාස්තාවික භාෂා
V. ආවස්ථිත නිපාත ක්‍රියා
VI. ඝෝෂ මහාප්‍රාණ හා අඝෝෂ මහාප්‍රාණ
VII. ස්ථානය හා කරණය
VIII. ප්‍රාදේශීය උපභාෂා

****************************